## ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දනට උඩරට සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් මස ලියන ලද එහෙත් අදාල භාණ්ඩ නොසැපයීම හේතුවෙන් 2012 පෙබරවාරි 28 දින වන විටත් නිකුත් කර නොතිබූ රු.25,145,466 ක් වටිනා චෙක්පත් 16 කින් රු.20,756,690 ක් වටිනා චෙක්පත් 05 ක් අවලංගු කර තිබුණි. එම චෙක්පත්වල වටිනාකම වර්ෂයේ වියදමට ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට සංවර්ධන කාර්යයන් නිම කිරීම පිණිස භාණ්ඩාගාරයෙන් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.53,513,844 ක මුදල් ශේෂයක් තිබියදී එය නොසලකා අවිච්ඡෙද හා බැරකම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු සේ සලකා රු.50,000,000 ක මුදලක් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් (ලැබිය යුතු අරමුදල්) සහ සමුච්චිත අරමුදල වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කරන ලද එහෙත් කිසිදු වියදමක් නොදරන ලද වටිනාකම රු.32,478,637 ක් වූ කර්මාන්ත 158 ක් පසු වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාව මත ඊට අදාල මුළු වටිනාකම වර්ෂයේ සංවර්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) අංක 56-6504 හා අංක 254-0401 දරන වාහන 2 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණද ස්ථාවර වත්කම් සහ රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනතේ 3(1) වගන්තිය | අධිකාරිය සතු බල ප්‍රදේශය දිස්ත්‍රික්ක 08 ක් තුළ ව්‍යාප්ත වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක සැලසුම් අනුව එය මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීයලේකම් කොට්ඨාශ 05 කට පමණක් සීමාවී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙ | |
| i. මු.රෙ.237 | භාණ්ඩ හෝ සේවා ලැබී ඇති බවට තොග සහතිකයකින් තොරව ගෙවීම් අනුමත කිරීම/සහතික කිරීම නොකළ යුතු වුවද රු.23,345,466 ක් වටිනා ගෙවීම් වවුචර් 16 කට අදාලව භාණ්ඩ ලැබී නොතිබියදී ගෙවීම් අනුමත කර සහතික කිරීමකින් ද තොරව චෙක්පත් ලියා තිබුණි. |
| ii. මු.රෙ.212 (2) | වැටුප් අත්තිකාරම් ලබාදිය හැක්කේ මාසික වැටුපෙන් 40% ක සීමාවට යටත්ව පමණක් වුවද ඊට පටහැනිව නිලධාරීන් දෙදෙනෙකු සඳහා 51% සිට 68% දක්වා වැටුප් අත්තිකාරම් ලබාදී තිබුණි. |

1.2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පවත්වාගෙන ගිය කිරිහල වසාදැමීම නිසා බදුකරුගෙන් අයවිය යුතුව තිබූ රු.107,500 ක බදු කුලි අදාල ණයගැති ගිණුමෙන් කපාහැර තිබූ අතර, ඒ සඳහා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සභාපතිවරයාගේ පිළිතුර පරිදි නීත්‍යානුකූල කටයුතු කර අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව සඳහන් වන හෙයින් ඉහත පරිදි ගිණුමෙන් කපා හැරීම යෝග්‍ය නොවන බව තහවුරු වේ.

1.2.4 දෘෂ්‍ය අක්‍රමිකතා/අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දිවි නැඟුම ගෘහ ආර්ථික ඒකක ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් පැල අවශ්‍යතාවය 5100 ක්ව තිබියදී නිසි පදනමකින් තොරව රු.306,000 ක් වටිනා පැල 10200 ක් මිලදී ගැනීම නිසා වැඩිපුර ලබාගත් පැල ක්ෂේත්‍රගත කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීමෙන් පාසැල් වල ගුරු භවතුන් හා ළමුන් අතර බෙදාදීමට සිදුව තිබුණි.

(ආ) දිවි නැඟුම සංවර්ධන වැඩසටහනට සමගාමීව සත්ව පාලන වැඩසටහන සඳහා කුකුළු පැටවුන් 3,024 ක් අවශ්‍යව තිබියදී නිශ්චිත පදනමකින් තොරව කුකුළු පැටවුන් 6000 ක් ඇනවුම් කිරීම හේතුවෙන් රු.892,800 ක් වටිනා කුකුල් පැටවුන් 2,976 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි. 2011 දෙසැම්බර් 31 දින වන විට එම කුකුල් පැටවන් ලැබී නොතිබුණද රු.1,800,000 ක් වූ මුළු වටිනාකම ගිණුම්ගත කොට චෙක්පත් ලියා තිබුණි. 2012 අප්‍රේල් වන විට එයින් පැටවුන් 1616 ක් පමණක් ලැබී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු. 5,679,287 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 7,561,888 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,882,601 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන වියදම් වැඩිවීම, පුද්ගල පඩිනඩි ගිවිසුම්ගත සේවා ඇතුළු වියදම්වල වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන අංශ 04 ක් යටතේ රු.මි. 300 ක් වූ සංවර්ධන කාර්යයන් 1147ක් ඉටු කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද ඉටු කර ගැනීමට හැකිවී තිබුණේ රු.මි.210 ක් පමණක් වූ කාර්යයන් වන අතර එහි ප්‍රතිශතය 70% ක් පමණ විය. මෙම වාර්තාවේ 1.2.1(අ) ඡේදයේ සඳහන් කරුණු සැලකිල්ලට ගත්විට සමාලෝචිත වර්ෂය සඳහා වූ භෞතික ප්‍රගතිය රු.මි. 185 ක් එනම් 61% ක් පමණ විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කහ සහ ඉඟුරු වගා කටයුතු ව්‍යාප්ත කිරීමේ අරමුණින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිර්දේශිත කහ, ඉඟුරු බෙදාදීමට කටයුතු යොදා තිබියදී ඉන් බැහැරව පිළිගත් සහතික කිරීමකින් තොරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ පුද්ගලික තවාන් කරුවකුගෙන් කහ සහ ඉඟුරු බීජ කි.ග්‍රෑ.7027 ක් වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් ආයතනයට රු.262,300 ක අලාභයක් සිදුව තිබුණු අතර එකී බීජ බහුතරයක් පැල නොවීම, කුණුවීම හා පසුව විනාශවීම යනාදී කරුණු හේතුවෙන් කහ/ඉඟුරු බීජ වෙනුවෙන් අධිකාරියට අයවිය යුතු (චකය අරමුදල යටතේ ලබාදුන්) 50% ක වාරික මුදල නිසි පරිදි අය කර ගෙනද නොතිබුණි.

(ආ) කඩුගන්නාව වෙළඳ සංකීර්ණයට අයත් කඩ කාමර 02 ක් කිරි ගොවි සමිතියක් හා මීමැසි පාලන සමිතියක් ලෙස සඳහන් කර සමාලෝචිත වර්ෂය තුල බදු දී තිබුණද එම කඩකාමර වෙනුවෙන් ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල වූ රු.200,000 ක් ලබාගෙන නොතිබුණු අතර වැඩිදුර පරීක්ෂා කිරීමේදී මෙවැනි කිරිගොවි සමිතියක් පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී නොමැති බව එහි අධ්‍යක්ෂ විසින් තහවුරු කර තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශය ලේකම් කොට්ඨාශ 03 ක ස්වයං රැකියා ලාභීන් වෙනුවෙන් රූපලාවන්‍ය උපකරණ සැපයීම සඳහා රු.2,338,590 ක් වැය කර තිබුණු අතර උපකරණ මිලදී ගැනීම පිණිස ආයතන 04 කින් මිල ගණන් කැඳවා තිබුණි. මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වලට අදාල පිරිවිතර කලින් නිර්ණය කර නොතිබීම, එක් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කළ ව්‍යාජ මිල ගණන් 03 ක් පදනම් කරගෙන මිලදී ගැනීම, ඇතැම් ආභරණ භාවිතයට නුසුදුසු ඒවා බවට අදාල ප්‍රතිලාභීන් තහවුරු කර තිබීම, හේතුවෙන් එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තියට සංශෝධිත 2011 මාර්තු 09 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය පරිදි ප්‍රාදේශීය ලේකම්වරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලැබූ නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් තෝරාගත් අනුමත සමිතයකට රු.මි. 2 ක දක්වා වූ කොන්ත්‍රාත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දිය හැකි වුවද, ඇස්තමේන්තුගත වටිනාකම රු. 13,894,175 ක් සහ

රු. 3,204,882 ක් වූ නාරංගස්පිටිය විවල පාලම සහ සිත්තෝඩය පාලම යන කොන්ත්‍රාත් එම සීමාව පිළිබඳව සැලකිලිමත් නොවී අනුමත සමිති 02 කට ලබා දී තිබුණි. එසේම, මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(11) උප වගන්තිය පරිදි එම සමිති සඳහා බැංකු ඇපකරයකින් තොරව අත්තිකාරම් ලබා දිය හැකි රු. 200,000 ක උපරිම සීමාව ඉක්මවා රු. 2,135,894 ක සහ රු. 288,549 ක අත්තිකාරම් අවිධිමත් පරිදි ගෙවා තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු.1,015,944 ක වූ පේරාදෙණිය උද්භිද උද්‍යානය තුල 18රු.x25රු. ප්‍රමාණයේ පැල අලෙවිසැලක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව අදාල ඉඩම පවරා නොගෙන , විධිමත් ගිවිසුමකින් තොරව සහ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයට පටහැනිව සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව 20% අත්තිකාරම් රු.199,560 ක් ගෙවා තිබුණි. වැඩ අයිතමයන් 05 කට අදාලව රු.220,904 ක අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු අතර ප්‍රමිතීන්ට අනුකූලව හා නිසි නිමාවකින් යුතුව එම ඉදිකිරීම නිම නොකිරීම හේතුවෙන් කරන ලද වැඩ වෙනුවෙන් ගෙවීම් අත්හිටුවා තිබුණි.

(ඇ) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාපාමඩුල්ල වසමේ කෙහෙල් දෙණිය පිට ඇල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාලව එහි ඇල පතුල අඟල් 06 ක ඝණකමට කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද ඉතා දුර්වල මිශ්‍රණයකින් යුතුව අඟල් 02 ක ඝණකමකින් කොන්ක්‍රීට් යෙදීම නිසා එහි පැවැත්ම අවිනිශ්චිත වන අතර ඊට අදාලව නොකළ වැඩ වෙනුවෙන් රු.154,017 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම ඇල ඉදිකිරීම සඳහා පස් කැපීමට වැඩිපුර ඇසතමේන්තු කර රු.21,695 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලවතුගොඩ වසමේ පොල්දෙණිය යාය කුඹුරේ ඇල සංවර්ධනය කිරීම සඳහා රු.731,000 ක මුදලකට ගිවිසුම් ගතවී තිබුණි. ඇලේ ධාරිතාවයට ප්‍රමාණවත ඝණකමකින් හා සවිමත් බවකින් තොරව අඟල් 4 ඝණකමින් ඇල බිත්ති සැලසුම්කර තිබීම, ඊට වඩා අඩු ඝණකමින් හා දුර්වලව ඇල පැති බැම් නිමකර තිබීම, වැර ගැන්වීමට යොදන ලද කම්බි නිරාවරණය වූ ස්ථාන පැවතීම, ඇතැම් ස්ථානවල අඟල් 3.25 කට වඩා අඩු ඝණකමින් පැවතීම වැනි කරුණු හේතුවෙන් ඇලෙ පැවැත්ම කෙටි කාලීන වීමද ඇල පතුල සඳහා නොකළ වැඩ වෙනුවෙන් රු.77,466 ක් වැඩිපුර ගෙවීම්ද සිදුකර තිබුණි.

(ඉ) අවලංගු කළ කර්මාන්ත
------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබූ ඇස්තමේන්තු ගත වටිනාකම රු.1,398,699 ක වූ කර්මාන්ත 07 ක් 2012 වසරට අවිච්ඡේද කර තිබුණු අතර ඉන් කර්මාන්ත 02 ක් සඳහා රු.43,620 ක අත්තිකාරම් මුදල්ද ගෙවා තිබුණද, පසුව එකී කර්මාන්ත 07 ම අවලංගු කර තිබුණි.

3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

නිසි සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව අධ්‍යක්ෂ සංවර්ධන සහ ඉංජිනේරු යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

3.6 වාහන උපයෝජනය

(අ) ආයතනය සතු පැරණි වාහන 03 ක් වර්ෂ 01 කට අධික කාලයක සිට කාර්යාල පරිශ්‍රය තුළ නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) වාහන 15 කට අදාලව 2012 ජනවාරි සිට 2012 අප්‍රේල් දක්වා මාස 04 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් 2008-2012 දක්වා පස් අවුරුදු කාලයකට අදාලව සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි අරමුණු ගත කාර්යන් බහුතරයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ පදනම් කර ගත් රු.මි. 300 ක වටිනාකමින් යත් විවිධ කර්මාන්ත හා කාර්යයන් 1147 ක් ඇතුළත් වුවද ඒ එක් එක් කර්මාන්ත ඇස්තමේන්තුගත අගයන් දැක්වෙන පරිදි සවිස්තරාත්මකව දක්වා නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැසමක් පිළියෙල කර ඇතත් එය තාත්වික පදනමෙන් යුතුව පිළියෙල කර නොතිබූ අතර එකී සැලැස්ම යාවත්කාලීන කිරීමක් හෝ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමක් සිදු කර නොතිබුණි.

## 4.5 අයවැය පාලනය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 08 කට අදාලව 16% සිට 99% දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණු අතර වැය විෂයයන් 08 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 38% සිට 312% දක්වා ප්‍රතිපාදන වෙනත් විෂයන්ගෙන් මාරු කර ගෙන තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක 29% සිට 100% දක්වා එනම් රු. 123,522,256 ක ඉතිරියක් පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ ඌනතා වරින් වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඇ) ගබඩා පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) වැටුප් අත්තිකාරම් ගෙවීම
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය

( උ) ගිණුම් පොත් පත් පවත්වා ගැනීම